www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | ඒකකය 4 |
|---|---|---|

## 4 ගිණුම්කරණය හැඳින්වීම

## I කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

**අංක 01 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාළව දී ඇති පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1) ගිණුම්කරණයේ පියා වශයෙන් සැලකෙන්නේ,
   1) අල්බට් අයින්ස්ටයින් ය.  2) අයිසැක් නිව්ටන් ය.
   3) ලූකා පැසියෝලි  4) කෙන්ස් සාමිවරයා

2) පහත සිද්ධීන් අතරින් ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැක්කේ,
   1) රු. 100000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම
   2) රු. 5000 ක විදුලි ගාස්තු ගෙවීම
   3) රු. 50000 ක බැංකු ණයක් ලබා ගැනීම
   4) රු. 25000 ක් වටිනා යන්ත්‍රයක් මිලට ගැනීමට තීරණය කිරීම

3) ගිණුම්කරණයේ අරමුණකි.
   1) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායක ද යන්න දැන ගැනීම.
   2) ගනුදෙනු හර හා බැර ලෙස සටහන් කිරීම.
   3) ගිණුම් තුලනය කර ශේෂ දැන ගැනීම.
   4) ව්‍යාපාරයට අලාභ සිදුවීම වලක්වා ගැනීම.

4) ගිණුම්කරණයේ දී වත්කම දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
   A. ව්‍යාපාරය විසින් පාලනය කිරීම.
   B. අනාගතයේ දී ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.
   C. අතීතයේ දී ව්‍යාපාරය අත්පත් කරගෙන තිබීම.
   D. අනාගතයේ දී ව්‍යාපාරයට හිමිකාරීත්වය ලැබීම.
   1) ABD  2) BAD  3) ABC  4) BCD

5) පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක දැකිය හැකි වත්කම් කිහිපයකි. මින් ජංගම වත්කම් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.
   1) මුදල් /ලී බඩු උපකරණ / ණය ගැතියෝ / භාණ්ඩ තොගය
   2) ඉඩම් හා ගොඩනැගිලි / ලී බඩු උපකරණ / මොටර් රථ / ආයෝජන
   3) ඉඩම් හා ගොඩනැගිලි / ණය ගැතියෝ / භාණ්ඩ තොගය / ලී බඩු
   4) මුදල් / ණය ගැතියෝ / භාණ්ඩ තොගය / ලැබිය යුතු ආදායම

පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක ගනුදෙනු තුලින් බිහිවන වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම් වේ.

A - මෝටර් රථ වාහන

B - විදුලි ගාස්තු



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

C - ලි බඩු උපකරණ
D - ප්‍රාග්ධනය
E - භාණ්ඩ තොගය
F - බැංකු ණය (කෙටි කාලීන)
G - මුදල් ශේෂය
H - ගෙවිය යුතු බදු කුලී
I - ණය හිමියෝ
J - ණය ගැතියෝ

**ඉහත තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

6) ජංගම වගකීම් දැක්වෙන අක්ෂර වන්නේ,
1) ADF 2) DFG 3) FHI 4) DEF

7) F, H වලින් දැක්වෙන්නේ,
1) වියදමක් හා වගකීමකි.
2) ජංගම නොවන වත්කම් ය.
3) වියදමක් හා ආදයමකි.
4) ජංගම වගකීම් ය.

8) ජංගම නොවන වත්කම් වන්නේ,
1) AB 2) AD 3) BI 4) AC

9) ජංගම වත්කමක් වන්නේ,
1) EGI 2) EGJ 3) ABC 4) JGC

10) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) ගිණුම්කරණය ව්‍යාපාරයක මූල්‍ය කටයුතු විධිමත් කිරීමට උපකාරී වේ.
2) කිසිම ව්‍යාපාරයකට ගිණුම් තැබීම නීතියෙන් නියම කර නැත.
3) ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක්ම ගිණුම්කරනයේ දී සැලකිල්ලට ගනී.
4) ව්‍යාපාරයක මූල්‍ය වාර්තා රහස්‍ය වන අතර ඒවා ව්‍යාපාරයේ අභ්‍යන්තර පාර්ශව පමණක් තීරණ ගැනීමට යොදා ගනී.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

## II කොටස

1) i) අ) ගිණුම්කරණය යන්න හඳුන්වන්න.

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

ආ) ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද?

.................................................................................................................................................

ii) අ) මූල්‍ය ප්‍රකාශය යනු කුමක්ද?

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

ආ) ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට පදනම් කර ගන්නේ මොනවාද?

.................................................................................................................................................

iii) පහත දැක්වෙන්නේ පියල්ගේ ව්‍යාපාරය සිදු වූ ගණුදෙනු කිහිපයකි. ඒවා අතුරින් ගිණුම්කරණයේ දී සැලකිල්ලට නොගන්නා ගනුදෙනු මොනවා ද?

1) රු. 20 000 ක භාණ්ඩ තොගයක් තෙතමනය නිසා විනාශ වීම.
2) රු. 5 000 ක ලැබිය යුතු ණය මුදලක් බොල්ණය බවට පත් වීම.
3) රු. 5 000 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කිරීම.
4) රු. 25 000 ක තොගයක් රවීගෙන් ණයට ගැනීම.
5) මසකට රු. 30 000 බැගින් ගෙවීමේ එකඟතාවය මත සේවකයින් දෙදෙනෙකු ව්‍යාපාරයට බඳවා ගැනීම

පිළිතුර :- ..................................................

iv) ව්‍යාපාරික වත්කම් සහ වගකීම් යන දෙකටම පොදු වූ ලක්ෂණය කුමක් ද?

.................................................................................................................................................

2) i) ව්‍යාපාරයක වත්කම් වර්ගීකරණය දක්වා උදාහරණ සපයන්න.

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

Agaram.LK - Keep your dreams alive!

ii) ව්‍යාපාරයක වගකීම් වර්ගීකරණය දක්වා උදාහරණ සපයන්න.

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

iii) මයන්ත දිසානායක ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහුගේ ව්‍යාපාරයේ පහත දැක්වෙන අයිතම දක්වා ඇති ශීර්ෂ යටතේ වර්ග කරන්න.

| අයිතම | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | ජංගම නොවන ව. | ජංගම වත්කම් | ජංගම නොවන වගකීම් | ජංගම වගකීම් |
| 1. අභ්‍යාස පොත් | | | | |
| 2. ගිණුම් වාර්තාකරණ පරිගණක | | | | |
| 3. හාෆ්ෂීට්, පැස්ටල් | | | | |
| 4. ණය පදනමට ගත් උපකරණ වලට ගෙවිය යුතු ණය | | | | |
| 5. ගොඩනැගිල්ල | | | | |
| 6. බැංකු ණය (දිගු කාලීන) | | | | |
| 7. සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ණය | | | | |
| 8. මුදල් ගණන් කිරීමේ යන්ත්‍ර | | | | |

agaram.lk

3) පහත දැක්වෙන අයිතමයක් වත්කම් / වගකීම් / හිමිකම් / ආදායාම් හා වියදම් වශයෙන් වර්ග කර දක්වන්න.

විදුලි ගාස්තු, බැංකු ණය, ලැබූ පොළී ආදායම්, විකුණුම්, ප්‍රාග්ධන, රක්ෂණ ගාස්තු, ආයෝජන, ණය ගැතියෝ, මුදල්, ලි බඩු, ණය හිමියෝ, ගැනිලි, මෝටර් රථ අළුත්වැඩියා වියදම්, ලද කුලී, ගෙවිය යුතු වැටුප්

| වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|
| | | | | |



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk